

කාර්ය සාධන වාර්තාව
செயலாற்று அறிக்கை
Performance Report

2022

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம் - இலங்கை
Department of Co-operative Development - Sri Lanka

කාර්යසාධන වාර්තාව

2022

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමාගේ පණිවුඩය



ශ්‍රී ලාංකේය ජන සමාජයේ උන්නතිය උදෙසා බිහි වූ සමුපකාර ව්‍යාපාරය නඟා සිටුවීම සඳහා කැපවන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) 2022 වර්ෂය සඳහා සකසනු ලැබූ කාර්ය සාධන වාර්තාව ඔබ අතට පත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

“ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය” යන්න දැක්ම කර ගනිමින් ජාතික සමුපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා පුළුල්ව මැදිහත් වීම, මෙහෙවර කර ගත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ලාංකේය සාමාන්‍ය ජන ජීවිතය හා අවියෝජනීයව බැඳී පවතී. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) ව්‍යුහය හා කාර්යභාරය පිළිබඳවත් අභ්‍යන්තර පරිපාලනය, මානව සම්බන්ධතා සංවර්ධනය සහ විගණන කටයුතු, නීති කටයුතු පිළිබඳවත් මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

2022 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව ජනතා ව්‍යවසායෙකු ලෙස නැඟී සිටීමට හැකියාව ලැබීම අප ලද සුවිශාල භාග්‍යයක් කොට සලකමි. සමුපකාර ව්‍යාපාරය සූර්ය බලශක්ති භාවිතයට යොමු කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ග්‍රාමීය නිෂ්පාදන ක්ෂේත්‍රය සංවර්ධන කිරීම සහ ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම වසර තුළද සිදු කල සුවිශේෂී මෙහෙයක් ලෙසින් සැලකීමට හැකියාව ඇත.

චීන රජයේ ආධාර යටතේ සහ ලෝක ආහාර වැඩසටහන යටතේ පාසල් සිසුන්ට සහල් බෙදා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ චීන රජයේ ආධාර යටතේ පාසල් සිසුන්ට නිල ඇඳුම් බෙදාදීම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ඇතුළු සුවිශේෂී වැඩසටහන් සඳහා නොමසුරු දායකත්වයක් දෙපාර්තමේන්තුව මඟින් 2022 වර්ෂය සඳහා සපයා දී ඇත. මෙවන් විපුල මෙහෙවරක නිරත සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමුපකාර ව්‍යාපාරය තුළ නියමු කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි සියළු කාර්යයන් 2022 වර්ෂයේ දී සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය දැක් වූ සැමට මාගේ කෘතඥතාවය පළ කරන අතර, විවිධ අභියෝගයන් හා බාධක හමුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වර්ෂය තුළ දායකත්වය දැක් වූ ගරු වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය නලින් ප්‍රනාන්දු මැතිතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, සියළුම පළාත් කොමසාරිස්වරුන් හා මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට හා දිවයින පුරා විසිරි පවතින සියලුම සමුපකාර සමිති වෙත මාගේ ස්තූතිය පුද කරමි.

ශ්‍රී ලාංකික ප්‍රජාවගේ මෙන්ම ලෝක ප්‍රජාවගේ ද තිරසාර සංවර්ධන අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා ශක්තිය ධෛර්ය හා අවකාශයන් රටේ සමුපකාරිකයන්ට ලැබෙවා යි ප්‍රාර්ථනා කරමි.

ඩී. ජීවනාදන්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පටුන

*සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමාගේ පණිවුඩය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යන්

1.4 සංවිධාන සටහන

1.5 දෙපාතර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.8 මූල්‍ය නොවන වෙනත් වත්කම් වාර්තාකිරීමේ කාර්ය සාධනය

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්

06 පරිච්ඡේදය

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

6.3 මානව සම්පත් සංවර්ධනය

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

සියවසකට ආසන්න කාලයක් පුරා ශ්‍රී ලාංකික ජන සමාජයේ උන්නතිය උදෙසා සුවිශේෂී ප්‍රතිපත්ති හා ආචාරධර්ම අනුව ක්‍රියාත්මකවන සමුපකාර ව්‍යාපාරය, වෙළඳපොල අභියෝග හමුවේ තම අරමුණු ළඟා කර ගැනීමට අපහසු ප්‍රජාව සවිබල ගන්වමින් ඔවුන්ගේ ආර්ථික සාමාජීය හා සංස්කෘතික අවශ්‍යතා ඉටුකර දීමට එක් වී සිටියි. මෙවන් අරමුණු පෙරදැරිව 1930 ඔක්තෝම්බර් මස 01 වන දින සමුපකාර දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද අතර කාර්යභාරය වඩාත් පුළුල් කරමින් 1945 වර්ෂයේ දී ‘‘සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව’’ ලෙස ස්ථාපිත කරන ලදී. එය වර්තමානයේ දී සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 දරණ ස්ථානයේ පිහිටා ඇත.

සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා කැපවීමෙන් කටයුතු කරනු ලබන මෙම දෙපාර්තමේන්තුව සමුපකාර ව්‍යාපාරය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙන්ම ඒ සඳහා අවශ්‍ය සුවිශේෂී ප්‍රතිපත්ති සහ සැලසුම් ගොඩනගමින් රාජ්‍ය ප්‍රතිපත්ති මුදුන් පමුණුවා ගැනීමට මහත් කැපවීමෙන් කටයුතු කරන අතර ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය වෙත නායකත්වය ලබා දීමේ වගකීම සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තනතුරෙහි වැඩ බලනු ලබන වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩී. ජීවනාදන් මහතා විසින් නොපිරිහෙලා ඉටු කරනු ලබයි.

අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති සංගම් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම්වල කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාළ කටයුතු සිදුකිරීමද මෙම දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරයකි. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සමීබන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාරයේ කටයුතු මෙහෙයවීම, ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහයවීම ඇතුළු රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීමද මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 යටතේ සකස් කරන ලද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 වාර්ෂික කාර්යසාධන වාර්තාව මෙමඟින් ඉදිරිපත් කෙරේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

දැක්ම

ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය

මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය
ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා
සානුබල සපයමින්
සමුපකාර සමිතිවල යහ පාලනය
ගොඩ නැඟීම සඳහා
පුළුල් ලෙස මැදිහත් වීම.

අරමුණු

1. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සමූපකාර සංවර්ධනය සඳහා අන්තර්ගත වන්නා වූ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පළාත් සමූපකාර දෙපාර්තමේන්තු සමග මනා සම්බන්ධීකරණයකින් යුතුව සමූපකාර ක්ෂේත්‍රය සංවර්ධනය උදෙසා හැකි උපරිම අයුරින් ආර්ථික, සමාජ හා සංස්කෘතික තත්ත්වයන් සම්පාදනය කිරීම.
2. වසර 2030 වනවිට තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ළඟාවීම සඳහා සමූපකාර ප්‍රතිපත්තිය සකස් කිරීම.
3. සමූපකාර ක්ෂේත්‍රයට අනුබද්ධිත ප්‍රජාවගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම තුළින් උසස් ජීවන තත්තවයක් ඇතිකරලීම.
4. සමූපකාර ව්‍යාපාරය තුළ යහපාලනය ගොඩනැගීම.

1.3 ප්‍රධාන කාර්යන්

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

1. අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති සංගම් ලියාපදිංචි කිරීම
2. ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම්වල කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාළ කටයුතු සිදුකිරීම
3. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සමීබන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාරයේ කටයුතු මෙහෙයවීම
4. ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහයවීම
5. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීම

අනෙකුත් කාර්යයන්

1. සමුපකාර සමිති ව්‍යවස්ථාපිත කටයුතු

i. සමිති ලියාපදිංචි කිරීම
ii. සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම

iii. සාමාජිකත්වය පිළිබඳ කටයුතු
iv. අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
v. නිලවරණ කටයුතු අධීක්ෂණය
vi. මහ සභා කැඳවීම / කාරක සභා කැඳවීම හා වලංගුභාවය තීරණය කිරීම
vii. ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
viii. තීරකකරණ කටයුතු සහ උසාවි බල ගැන්වීම්
ix. සමුපකාර සමිති / සංගම්වල වාර්ෂික විගණනයන් සිදුකිරීම

2. කළමනාකරණ කටයුතු

i. පාලක මණ්ඩල පත් කිරීම / අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම
ii. ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණය
iii. විගණනය
iv. පනතේ විධිවිධාන පරිදී සාමාන්‍ය / විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
v. කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

3. සම්බන්ධීකරණ කටයුතු

i. සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ව්‍යවසායන් සමඟ සම්බන්ධීකරණය
ii. පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයට සහයවීම
iii. ජාත්‍යන්තර සමුපකාර සංධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
iv. සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය
v. සමුපකාර සමිති වලට අදාළ සංඛ්‍යා ලේඛණ පිළිබඳව මහ බැංකුව හා ජන ලේඛනණ හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය
vi. අවශ්‍ය අවස්ථාවන්හි දී රජයේ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
vii. සමුපකාර සමිති / සංගම් අතර සම්බන්ධීකරණය

4. සංවර්ධන කටයුතු

i. වාර්ෂික අය වැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටු කිරීම
ii. සමුපකාර සමිතිවල යහ පාලනය සහතික කිරීමට අදාළ කටයුතු ඉටු කිරීම
iii. සමුපකාර සමිති හා සංගම්වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම
iv. සමුපකාර සමිති හා සංගම්වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය
v. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
vi. සංවර්ධන ආධාර හා සානුබල සැපයීම
vii. සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය
viii. සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය
ix. සේවක / නිලධාරී සුභසාධනය

5. අරමුදල් පාලනය

i. දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ සමුපකාර අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය

ii. ව්‍යවස්ථාපිත සමිතිවල වාර්ෂික විගණනයෙන් පසු වෙන් කරනු ලබන දායක මුදල් අය කර ගැනීම

iii. සමුපකාර සමිතිවල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබාදීම

iv. ණය ආපසු අය කර ගැනීම

v. ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීම

6. අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු

i. සාමාන්‍ය පරිපාලනය

ii. මානව සම්පත් කළමනාකරණය

iii. කාර්ය සාධනය වර්ධනය

iv. වත්කම් කළමනාකරණය

1.4 සංවිධාන සටහන

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය



1.5 දෙපාතර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල

දෙපාතර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල කිසිවක් නොමැත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

සමුපකාර සංවර්ධන අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

සමුපකාර අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(3) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44(i) සිට 44(iii) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඇවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණයහිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අය විය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

දෙපාර්තමේන්තුව යටතේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති නොමැත.

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ආංශික ප්‍රගතිය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	අංශය	ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ඉටුකරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ප්‍රතිශතය
01	සමිති	43	30	70%
02	බැංකු නියාමන	36	35	97%
03	නීති	10	05	50%
04	තොරතුරු තාක්ෂණ	31	16	52%
05	විගණන	16	13	81%
06	පාලන	36	27	75%
07	සංවර්ධන	53	28	53%
08	පුහුණු	05	05	100%
එකතුව		230	159	69%

විශේෂ / ජයග්‍රහණ

අංශය	ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ඉටුකරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ප්‍රතිශතය
සී/ස විචිත්‍ර පැළෑටි සහ උඩවැඩියා සමුපකාර සමිතිය - ලක්මල් උයන ව්‍යාපෘතිය.	5	4	80%
සමුපකාර ව්‍යාපාරය සූර්යබල ශක්ති භාවිතයට යොමු කිරීම.	6	4	67%
ඒකීය භාණ්ඩ ගැණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම.	4	2	50%
කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම.	6	2	33%
ග්‍රාමීය නිෂ්පාදන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම	6	1	17%
සමුපකාර අලෙවි ජාලය ව්‍යාප්ත කිරීම සහ නවීකරණය මගින් පාරිභෝගික සේවා පුළුල් කිරීම.	12	11	92%
විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභා සවිබල ගැන්වීම.	6	3	50%
කහ නිෂ්පාදන ව්‍යාපෘතිය	4	1	25%
ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ගෙවතුවගා වැඩසටහන	4	-	-
වෙනත් ව්‍යාපෘති			
පාසල් සිසුන්ට සහල් බෙදාදීමේ වැඩසටහන - චීන ආධාර යටතේ (පළමු පියවර)			100%
පාසල් සිසුන්ට සහල් බෙදාදීමේ වැඩසටහන - චීන ආධාර යටතේ (දෙවන පියවර)			95%
පාසල් සිසුන් සඳහා සහල් බෙදාදීම- ලෝක ආහාර වැඩසටහන යටතේ			95%
පාසල් සිසුන්ට නිල ඇඳුම් බෙදාදීම - චීන ආධාර යටතේ			20%
අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම කඩදාසි ආනයනය කිරීම - ඉන්දියානු ණය යෝජනා			10%

අභියෝග

- 2022 වර්ෂයේ රටේ පැවතුණු අභියෝගකාරී ආර්ථික තත්ත්වයත් සමග සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීමට සීමා කිරීමට සිදු වූ අතර, සැලසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සීමා කිරීමටද සිදුවීම.
- සමුපකාර ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිති නියාමනය මඟින් තැම්පත්කරුවන්ගේ තැම්පත් සුරක්ෂිත කිරීම සහ සමුපකාර මූල්‍ය සේවා ව්‍යාපාරය කෙරෙහි තැම්පත්කරුවන්ගේ විශ්වාසය ඇති කිරීමත්, මූල්‍ය සේවා සමුපකාර සමිති ශ්‍රී ලාංකික ජනතාව අතර ප්‍රචලිත කිරීමත් සිදු කිරීම.

ඉදිරි ඉලක්ක

- නිෂ්පාදන ක්ෂේත්‍රය ඉලක්ක කරගනිමින් දේශීය නිෂ්පාදන සංවර්ධනය සඳහා අවශ්‍ය මගපෙන්වීම් පළාත් සමුපකාර සංවර්ධන දෙපර්තමේන්තු වෙත ලබාදීම.
- ලක්මල් උයන ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම මඟින් මල් හා විසිතුරු පැළ අපනයනයට යොමු කිරීම.
- සමුපකාර ව්‍යාපාරය සූර්යබල ශක්ති භාවිතයට යොමු කිරීම
- පොදු ජනතාව අතර මූල්‍ය සේවා සමුපකාර ව්‍යාපාරය පිලිබඳ විශ්වාසය තහවුරු කිරීමටත් ජාතික ආර්ථිකය තුල ඉතුරුම් වර්ධනය කිරීමත් සිදු කිරීම.
- ග්‍රාමීය නයගතිකම සහ අධික පොලී අනුපාත යටතේ ණය ලබාගනිමින් සිදුවන ආදායම් අසම ව්‍යාප්තිය පිලිබඳ ගැටළු විසඳීම.
- සමුපකාර මූල්‍ය සේවා අංශයේ සියලුම සමුපකාර ආයතනවල සංඛ්‍යාත්මක තොරතුරු ඒකරාශී කිරීම සාහ සමිති ශ්‍රේණිගත කිරීම
- සමස්ත සමුපකාර ව්‍යාපාරය ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සමුපකාර අලෙවි ජාලය ව්‍යාප්ත කිරීම සහ නවීකරණය මඟින් පාරිභෝගික සේවා පුළුල් කිරීම.
- ඒකීය භාණ්ඩ ගැනුම් ක්‍රමයක් ස්ථාපිත කිරීම.

ඩී. ජීවනාදන්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

ඩී. ජීවනාදන්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක 330, යුනියන් පෙදෙස,
කොළඹ 02.

03 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-ඒෆ්

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2			ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		221,010,000	127,636,000	ඒසිඒ-3
-	තැන්පතු		720,425	41,800	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		4,676,916	6,998,557	ඒසිඒ-
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				5/5(ඒ)/5 (බී)
-	**මුළු ආදායම් නොවන pලැබීම් (ආ)**		**226,407,341**	**134,676,357**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**226,407,341**	**134,676,357**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**226,407,341**	**134,676,357**	
	අඩුකළා : වියදම්				
72,800,000	**පුනරාවර්තන වියදම්**		-	-	
58,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	56,801,907	55,619,512	
12,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	13,568,874	14,363,722	ඒසිඒ-2(ii)
2,300,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	671,524	745,857	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
72,800,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**71,042,305**	**70,729,091**	
21,200,000	**මූලධන වියදම්**				
700,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	273,156	545,344	
-	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	290,600	
20,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	18,987,144	59,378,881	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
500,000	හැකියා වර්ධනය	14	225,617	251,268	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
21,200,000	**මුළු මූලධන වියදම් (උ)**		**19,485,917**	**60,466,093**	
	තැන්පතු ගෙවීම්		245,611	78,671	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		4,104,929	4,176,316	ඒසිඒ-5/5(ඒ)
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	/5(බී)
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**4,350,540**	**4,254,987**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**94,878,762**	**135,450,171**	
-	**අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය**		**131,528,579**	**(773,814)**	ඒසිඒ-7
	2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		**131,528,579**	**(773,814)**	ඒසිඒ-3

3.2 මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට **ඒසිඒ-පී**

මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2022	**2021**
		රු.	**රු.**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	**ඒසිඒ-6**	52,807,209	52,904,209
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	**ඒසිඒ-5/5(ඒ)**	10,797,136	11,369,124
මුදල් හා මුදල් සමාන දෑ	**ඒසිඒ-3**	-	-
මුළු වත්කම්		63,604,345	64,273,333
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		7,410,692	8,457,494
දේපළ පිරියත හා උපකරණ සංචිතය		52,807,209	52,904,209
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5 (බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	**ඒසිඒ-4**	3,386,444	2,911,630
අග්‍රිම ශේෂය	**ඒසිඒ-3**	-	-
මුළු වගකීම්		**63,604,345**	**64,273,333**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙලිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ඒ.එම්.පී.එම්.බී. අතපත්තු
තනතුර : ලේකම්, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
දිනය : 2023/10/09

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු.
ලේකම්
වෙළෙඳ, වාණිජ හා
ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

.....
ගණන්දීමේ නිලධාරි
නම : ඩී. ජීවනාදන්
තනතුර : සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
දිනය : 2023/09/27

ඩී. ජීවනාදන්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක 330, යුනියන් පෙදෙස.
කොළඹ 02.

.....
~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ටී.එම්.ඊ.එච්. සරත්චන්ද්‍ර
දිනය : 2023.09.27

ටී. එම්. ඊ. එච්. සරත්චන්ද්‍ර
ගණකාධිකාරි
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
කැ.පෙ. 419, අංක. 330, යුනියන් පෙදෙස,
කොළඹ 02.

3.3 මුදල් ප්‍රවාහය පිලිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

	ප්‍රත්‍ය	
	2022	**2021**
	රු.	රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	3,011,989	3,284,284
වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මඟින් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	221,010,000	127,636,000
අත්තිකාරම් අයකර ගැනීම්	3,877,023	5,265,035
තැන්පතු ලැබීම්	720,425	41,800
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**228,619,437**	**136,227,119**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	89,604,213	130,082,317
සහනාධාර සහ මාරුකිරීම්	671,524	745,857
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	133,993,160	853,358
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	4,104,929	4,176,316
තැන්පතු ගෙවීම්	245,611	78,671
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**228,619,437**	**135,936,519**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**0**	**290,600**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	-	290,600
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**-**	**290,600**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**-**	**(290,600)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**

අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) –(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනවල % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	70,600,000	72,800,000	71,042,305	97.58%
මූලධන	21,200,000	21,200,000	19,485,917	91.89%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	වාර ප්‍රවේශ පත්‍ර සඳහා	252,485	252,485	252,485	100%

3.8 මූල්‍ය නොවන වෙනත් වත්කම් වාර්තාකිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	52,807,209.00	52,807,209.00	නැත	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

(14) A

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } TAC/C/CODD/FA/2022 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 29 දින

සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් 29 MAY 2023

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 29 MAY 2023 (මුදල් කාණ්ඩය) කොළඹ - 02.

ශීර්ෂ 301 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 301 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටස් තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 301-1-1-1505 වැය විෂය යටතේ රු.1,505,000 ක ප්‍රතිපාදනයක් කර මුළු ප්‍රතිපාදනයට ඉතිරි වී තිබුණි. මෙම ප්‍රතිපාදනය NEDAC/ICT සහ CICTAB ආයතන වල සාමාජික මුදල් ගෙවීම සඳහා සිදුකර තිබුණද. එම ආයතනවල සාමාජිකත්වය තව දුරටත් පවතින්නේ ද යන්න විගණනයට තහවුරු නොවිය.

(ආ) වැය විෂයය 301-1-1-1-1003 සඳහා මු.රෙ.208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම වූ රු.252,485 ක් මූල්‍ය ප්‍රකාශයේ ACA-2 (ii) ආකෘතියේ මුදල් පොත අනුව වියදමටම එකතු කොට දක්වා තිබුණි.

(ඇ) වැය විෂයය 1303 හා 2202 සඳහා ප්‍රතිපාදන ඉතිරිය පිළිවෙලින් රු.15,950 ක් හා රු.1,012,856 ක් වූ අතර එම ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා හේතු මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කර නොතිබුණි.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.284,762 ක් වටිනා බැරකම් මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (iii) ආකෘතියේ දක්වා නොතිබුණි.

(ආ) වැය විෂයයන් 6 ක් සඳහා වූ රු.307,595 ක බැරකම් නිදහස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ අතර එම වැය විෂයයන්හි ඉතිරි ප්‍රතිපාදනය රු.51,712 ක් පමණක් විය.

2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කලයුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික වියයුතු වුවත්. වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2020 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි 2.2 ඡේදය ප්‍රකාරව සෑම මූල්‍ය වාර්තාකරණ ආයතනයක් විසින්ම තම ආයතනයට අදාල සහ අදාල නොවන මූල්‍ය වාර්තාකරණ ආකෘති හඳුනාගත යුතු අතර අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘති පමණක් භාවිතා කලයුතු වුවද අදාල නොවන මූල්‍ය වාර්තාකරණ ආකෘතිද භාවිතා කර තිබුණි.

2.6 තැන්පතු

වන්දි සම්බන්ධයෙන් වූ පොදු තැන්පත් ගිණුමේ (6000-0-0-17-0-32) 2022 ජනවාරි 01 දිනට ශේෂය රු.2,903,644 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ රු.2,879,594 ක ශේෂයක් පැවතුණි. ඒ අනුව වර්ෂය තුල රු.24,050 ක ශේෂයක් පමණක් නිරවුල් වී තිබුණි. විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම තැන්පතු වර්ෂ 08-12 කාලයක සිට පවතින ශේෂයන් වූ අතර පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කල දිනය සඳහන් කර තිබුණ ද වර්ෂ අවසාන සිගැස් ශේෂ ලැයිස්තුවේ ඉහත ශේෂයන් 2015 දෙසැම්බර් 31 ලෙස සඳහන් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ 2 ට වඩා පැරණි තැන්පත් රාජ්‍ය ආදායමට බැර කලයුතු වුවත් රු.2,879,594 ක වන්දි මුදල් වර්ෂ 8 -12 ක කාලයක් තිස්සේ ආදායමට නොගෙන පැවතුන අතර එසේ සිදු නොකිරීමට හේතුව ලෙස වන්දි සම්බන්ධ නඩු අවසන් වී නොමැති බව තැන්පත් ගිණුමේ සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. එසේ වුවත් එම ශේෂ සියල්ලට

අදාලව නඩු කටයුතු අවසන් නොමැති බවට ප්‍රමාණවත් තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 මාර්තු 17 දින විගණනයට ඉදිරිපත් කරන ලද කෙටුම්පත් කාර්යසාධන වාර්තාවට අනුව සංවර්ධන ව්‍යාපෘති 08 ක සියයට 17 සිට සියයට 92 ක ප්‍රගතියක් වාර්තා කර තිබුණත්, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ගෙවතු වගා වැඩසටහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති 08 ට අදාල ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ ක්‍රියාකාරකම් 50 කින් ක්‍රියාකාරකම් 22 ක් ම ඉටු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට අයත් අංශ 08 ක් සඳහා ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ ක්‍රියාකාරකම් 270න් ක්‍රියාකාරකම් 97 ක් ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්තිකාරම් 'බී' ගිණුමේ ඇමුණුම 05 ට අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර වෙනසට හේතු පැහැදිලි කල යුතු වුවත් රු.160,598 ක් වූ වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශ වලට ස්ථාන මාරු වී ගිය අය නොවූ ණය ශේෂ අතර වසර 33 ක් පැරණි රු.40,172 ක ණය ශේෂයක් පැවති අතර පළාත් සභා ආයතන වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 32 ක් පැරණි ණය ශේෂ වටිනාකම රු.47,353 ක් බව නිරීක්ෂණය විය. 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ට අදාලව නිකුත් කල මාර්ගෝපදේශ අංක 01 හි සඳහන් පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාන මාරු වී ගිය අය නොවී පැවති වර්ෂ 30 ක් පැරණි රු.19,262 ක හා වර්ෂ 23 ක් පැරණි රු.40,650 ක ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂයේදී ගිණුමෙන් ඉවත් කර තිබුණු අතර එසේ ඉවත් කිරීමට අදාල භාණ්ඩාගාර අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවුනි.

(ඈ) වැඩ තහනම් කල නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.70,401 ක ණය ශේෂයක් වසර 25 ක් තිස්සේ අයනොවී පැවතුණු අතර සේවය හැරගිය නිලධාරියෙකුගෙන් අයවිය

යුතු රු.48,720 ක ණය ශේෂයක් වසර 41 ක කාලයක සිට අය නොවී පැවතුණි.ඒ සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ට අදාලව නිකුත් කල මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4. තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

2018 ජූලි 17 දිනැති අංක 4/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඉටුකර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර 2020 වර්ෂයේ සිටම වර්ෂ 2 කට අධික කාලයක සිට පුරප්පාඩු පැවතීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 151 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 84 ක් වූයෙන් පුරප්පාඩු 67 ක් පැවතුණි.

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	12	06	06
තෘතියික	110	68	42
ද්විතියික	09	02	07
ප්‍රාථමික	20	08	12
එකතුව	**151**	**84**	**67**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 6 න් නියෝජ්‍ය කොමසාරිස් තනතුරක් හා සහකාර කොමසාරිස් තනතුරු 2 ක් වසර 5 කට වැඩි කාලයක සිටද, දෙපාර්තමේන්තුගත නියෝජ්‍ය කොමසාරිස් තනතුර, අභ්‍යන්තර විගණක තනතුර හා නීති නිලධාරී තනතුර වර්ෂ 3 ක කාලයක සිටද පුරප්පාඩුව පැවතුණි.

(ආ) ද්විතීයික මට්ටමේ වූ භාෂා පරිවර්තක තනතුර වර්ෂ 5 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

බ.පී.අයි.නිරංජා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100%-90%	89%-75%	74%-50%	< 50%
සී/ස විචිත්‍ර පැළෑටි සහ උඩවැඩියා සමුපකාර සමිතිය - ලක්මල් උයන ව්‍යාපෘතිය.		80%		
සමුපකාර ව්‍යාපාරය සුර්යබල ශක්ති භාවිතයට යොමු කිරීම.			67%	
ඒකීය හාණ්ඩ ගැණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම.			50%	
කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම.				33%
ග්‍රාමීය නිෂ්පාදන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම				17%
සමුපකාර අලෙවි ජාලය ව්‍යාප්ත කිරීම සහ නවීකරණය මගින් පාරිභෝගික සේවා පුළුල් කිරීම.	92%			
විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභා සවිබල ගැන්වීම.			50%	
කහ නිෂ්පාදන ව්‍යාපෘතිය				25%
ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ගෙවතුවගා වැඩසටහන				-

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
	-	-	-	-	-
	-	-	-	-	-
	-	-	-	-	-

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන අභිමතාර්ථවලට අරමුණු 17ක් සහ ඒ හා සම්බන්ධ ඉලක්ක 169ක් පමණ ඇතුලත්ව ඇත. නමුදු මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම ගැටලුකාරී වී ඇත. එයට එක් හේතු සාධකයක් වී ඇත්තේ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට මනා හැකියාවක් සහ දැනුමක් සහිත ජ්‍යෙෂ්ඨ මට්ටමේ මාණ්ඩලික නිලධාරියෙකු ඇතුළු නිලධාරීන් නොමැති වීම හේතුවෙන් වන අතර ඉදිරියේදී එම ගැටලුව නිරාකරණය කර ගනිමින් දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම සඳහා නිලධාරීන් පුහුණු අවස්තාවන් සඳහා යොමු කිරීමට අපේක්ෂා කරමි.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්	01	01	00
	නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය II, III)	04	01	03
	ගණකාධිකාරී (ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය III/ II)	01	01	00
	අභ්‍යන්තර විගණක (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය III/ II)	01	00	01
	නියෝජ්‍ය කොමසාරිස් /සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු ගත)	03	ස්ථිර - 02 වැඩබලන - 01*	01
	නීති නිලධාරී (දෙපාර්තමේන්තු ගත)	01	00	01
	සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය I)	01	01	00
	එකතුව	**12**	ස්ථිර **- 06** වැඩබලන **- 01***	**06**
තෘතීය මට්ටම	පරිපාලන නිලධාරී	01	01**	01
	සමුපකාර සංවර්ධන නිලධාරී (අධි ශ්‍රේණිය)	05	ස්ථිර 02 රා.ආවරණ 03***	03
	භාෂා පරිවර්තක	01	00	01
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය III, II)	02	00	02
	එකතුව	**09**	**02**	**07**
ද්විතීය මට්ටම	සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර	37 25 } 62	14 24 } 38	24 ****
	සමුපකාර සංවර්ධන නිලධාරී			
	සංවර්ධන නිලධාරී	15	13	02
	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය III, II)	05	03	02
	කළමනාකරණ සේවා නිලධාරී	28	14	14
	එකතුව	**110**	**68**	**42**
ප්‍රාථමික මට්ටම	රියදුරු	05	03	02
	කාර්යාල කාර්ය සහයක	15	05	11
	එකතුව	**20**	**08**	**12**
මුළු එකතුව		**151**	**84**	**67**

*සහකාර කොමසාරිස්වරයෙකු විසින් නියෝජ්‍ය කොමසාරිස් තනතුරෙහි රාජකාරී ඉටු කරනු ලබන අතර, දිස්ත්‍රික් නිලධාරී තනතුරෙහි නිලධාරියෙකු විසින් සහකාර කොමසාරිස් තනතුරෙහි වැඩ බැලීම කරනු ලබයි.

**කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ නිලධාරිනියක් පරිපාලන නිලධාරී තනතුරේ වැඩ බැලීමට පත් කර ඇත.

***සමුපකාර සංවර්ධන නිලධාරී (අධි ශ්‍රේණිය) තනතුරු 03 සමුපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකු රාජකාරී ආවරණය කරනු ලබයි

****සමුපකාර ප්‍රවර්ධන විමර්ශන සහකාර තනතුරු සඳහා ඉදිරියේදී බඳවාගැනීම් නොකිරීමටත්, පුරප්පාඩු වන සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර තනතුරු සඳහා සමුපකාර සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමටත්, සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර තනතුරු සහ සමුපකාර සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව ඒකාබද්ධව 62 ක් ලෙස පවත්වා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමිවී ඇත.

6.2 ආයතනයේ කාර්ය සාධන උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයෙහි බලපෑම

මේ වන විට දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහල නැංවීම උදෙසා අත්‍යාවශ්‍යම තනතුරු සඳහා පුරප්පාඩු පවතී. උදාහරණයක් ලෙස;

- සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් - 01 (වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු විසින් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තනතුරෙහි රාජකාරී කටයුතු ඉටු කරනු ලබයි)
- නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ. II, III) - 03
- අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ. III/ II) - 01
- නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු ගත) - 01 (සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් තනතුරෙහි පුරප්පාඩුව සඳහා සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණියේ නිලධාරිනියක් රාජකාරී ආවරණය කරනු ලබයි)
- නීති නිලධාරී (දෙපාර්තමේන්තු ගත) - 01
- පරිපාලන නිලධාරී - 01 (කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ නිලධාරිනියක පරිපාලන නිලධාරී තනතුරෙහි රාජකාරී ආවරණ කටයුතු ඉටු කරනු ලබයි)
- සමුපකාර සංවර්ධන නිලධාරී (අධි ශ්‍රේණිය) - 03 (සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය පුරප්පාඩු 03 සඳහා සමුපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙක් රාජකාරී ආවරණය කරනු ලබයි)
- භාෂා පරිවර්තක - 01
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (ශ්‍රී.ලං.තො.හා ස.තා.සේ. III, II) - 02
- සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර/ සමුපකාර සංවර්ධන නිලධාරී - 24 (සමූපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර නිලධාරීන් සහ සමූපකාර සංවර්ධන නිලධාරීන් එකම රාජකාරී ඉටුකරනු ලබන බැවින් එම තනතුරු පුරපුපාඩු ඒකාබද්ධව පවත්වා ගෙන යනු ලැබේ)
- සංවර්ධන නිලධාරී - 02
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර (ශ්‍රී.ලං.තො.හා ස.තා.සේ. III, II) - 02
- කළමනාකරණ සේවා නිලධාරී - 14
- කාර්යාල කාර්ය සහයක - 10

මෙම තත්ත්ව යටතේ දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීමට බාධා මතුවී ඇත. විධායක මට්ටමේ තනතුරු පුරප්පාඩු වීම මත ආයතනයේ දැනට සේවයේ නියුතු නිලධාරීන් 84 දෙනෙකුගේ පරිපාලන හා ආයතන කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමටත් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ කටයුතු කාර්යක්ෂම කිරීමටත් බාධා සිදු වේ.

සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර සහ සමුපකාර සංවර්ධන නිලධාරී තනතුරු පුරප්පාඩු වීම හේතුවෙන් ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම්වල කටයුතු මෙහෙයවීම, විගණන කටයුතු සිදුකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු සිදුකිරීම ආදී අපේක්ෂිත ඉලක්කයන් කරා ලගා වීම දුෂ්කර වී ඇත.

මෙලෙස තනතුරු පුරප්පාඩුවව පැවතීම හේතුවෙන් එක නිලධාරියෙකුට විෂයන් කිහිපයක කාර්යයන් ඉටුකිරීමට සිදුවීම නිසා දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීම දුෂ්කර වී ඇති අතර ප්‍රමාණවත් තරම් අධීක්ෂණ මට්ටමේ නිලධාරීන් නොමැතිවීම දෙපාර්තමේන්තුවේ දැක්ම සඳහා ලගාවීමට බාධාවක් වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
සමුපකාර සමිති/ සංගම් විගණනයේ දී අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණු වැඩසටහන	45	2022 මාර්තු 25	74,850.00	-	දේශීය	සමුපකාර සමිති/ සංගම් විගණනයේ දී අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම
46(1) පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ පුහුණු වැඩසටහන	35	2022 අප්‍රේල් 1,2	146,620.00	-	දේශීය	46(1) පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ දැනුම
සමුපකාර සමිති/ සංගම්වල අතිරික්ත අරමුදල් ආයෝජන අවස්ථා පිළිබඳ පුහුණු වැඩසටහන	86	2022 නොවැම්බර් 17	178,500.00	-	දේශීය	සමුපකාර සමිති/ සංගම්වල අතිරික්ත අරමුදල් ආයෝජන අවස්ථා පිළිබඳ දැනුම
සමුපකාර මුදල් රෙගුලාසි සංග්‍රහය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	45	2022 නොවැම්බර් 26	193,067.00	-	දේශීය	සමුපකාර මුදල් රෙගුලාසි සංග්‍රහය පිළිබඳ දැනුම
ආයතන සංග්‍රහය හා සේවක විනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	65	2022 දෙසැම්බර් 02	158,680.00	-	දේශීය	ආයතන සංග්‍රහය හා සේවක විනය පිළිබඳ දැනුම
සමුපකාර මුදල් රෙගුලාසි සංග්‍රහය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	78	2022 දෙසැම්බර් 27	157,050.00	-	දේශීය	සමුපකාර මුදල් රෙගුලාසි සංග්‍රහය පිළිබඳ දැනුම

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුව විසින් මෙවැනි ගිණුම් භාවිතා කරනු නොලබයි	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.6	වෙනත්			
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතන තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී	අනුකූල වේ		

	ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම			
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශය නොමැති වීමෙන් අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොමැත	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර විගණක තනතුරෙහි පුරප්පාඩුව පුරවන ලෙසට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නොමැත.	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිතව නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයට අදාළ කටයුතු සිදු කිරීමට නොහැකිවී ඇති අතර ඒ සඳහා අවශ්‍ය අභ්‍යන්තර විගණක තනතුරෙහි පුරප්පාඩුව පුරවන ලෙසට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන විමසුම් නොලැබේ.	
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන වාර්තා සකස් කරනු නොලබයි.	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වරයාට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන වාර්තා සකස් කරනු නොලබයි.	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු	අනුකූල වේ		

	කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම			
8.2	ඊහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත් කිර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලේචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එමශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කිරීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		

11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රදිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	වර්ෂ ගණනක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම අවසන්ව නැත	වර්ෂ ගණනක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලේචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.317 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුව සතුව ආදායම් ගිණුම් නොමැත	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම්	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන්සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		



වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

දුරකථන : 0112-478373
0112-478374
ෆැක්ස් : 0112-478386
වෙබ් : www.coop.gov.lk
ඊ-මේල් : info@coop.gov.lk